# සාම්ප්‍රදායික මීමුරේ ගම්මානයෙහි අතීත ජන ජීවිතය හා සබැඳි සමාජ, ආර්ථික හා සංස්කෘතික සාධක පිළිබඳ ව විමර්ශනාත්මක අධ්‍යයනයක්

එම්.එම්.එන්.එස්. විජේරත්න*, එච්.පී. සමරනායක, එම්.ඩබ්ලිව්.ඒ.කේ.කේ. විතානාරච්චි

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
Nadee123a@gmail.com*

**මුඛ්‍ය පද** - මීමුරේ ගම්මානය, මධ්‍යම පළාත, ලකේගල, නකල්ස් කඳු වැටිය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ පිහිටා ඇති හුදකලා මෙන්ම සුන්දර ගම්මානයක් ලෙස මීමුරේ ගම්මානය හඳුනාගත හැකි ය. ගම්මානයට නැගෙනහිරෙන් පිරමීඩ හැඩති ලකේගල කන්ද පවතින අතර දර්ශනීය නකල්ස් කඳු වැටියට බටහිරට මායිම් වේ. මීමුරේ ගම්මානයට උතුරු පසින් පිටවල පතන තෘණ භූමිය පිහිටා ඇති වනාන්තරයක් වන අතර, දකුණු පසින් හීන් ගඟට මායිම් ව ඇත. මෙම ගම්මානයට පිවිසීම සඳහා මහනුවර හරහා හුන්නස්ගිරියට පැමිණි පසු ලූල්වත්ත නම් ගම හමුවේ. එයින් කිලෝමීටර 15ක් පසුකර ගිය පසුව සුන්දර මීමුරේ ගම්මානය හමුවේ. මෙමඟින් මීමුරේ ග්‍රාමීය ජනයා හා සබැඳි අතීත ජන ජීවිතය ඔස්සේ සමාජ, ආර්ථික හා සංස්කෘති පසුබිම පිළිබඳව අධ්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යනයේ දී අප කණ්ඩායම ක්ෂේත්‍රය වෙත ගොස් ඒ පිළිබඳව අධ්‍යනය කළ අතර වර්තමානය වන විට ගමෙහි ජීවත්වන ජ්‍යෙෂ්ඨ සාමාජිකයින් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් මෙම අධ්‍යනය සඳහා තොරතුරු ලබාගන්නා ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ශ්‍රී ලංකාවේ පිහිටා තිබෙන ග්‍රාමීයත්වය හා සුන්දරත්වය නොමඳ ව අන්තර්ගත ග්‍රාමයක් වශයෙන් මීමුරේ හඳුනාගත හැකි ය. ග්‍රාමීයත්වය හා අව්‍යාජත්වය මනා ලෙස අනූන මෙම ග්‍රාමීය ජනයාගේ ජීවිතය හා සබැඳි ගැමි ජීවිතය පිළිබඳව අධ්‍යයනය කිරීමේ දී ඔවුන්ගේ අතීතයේ පැවති සමාජ, ආර්ථික හා සංස්කෘතික පසුබිම පිළිබඳ ව සාකච්ඡා කිරීම ඉතාම වැදගත් වේ. වර්තමානය වන විට මෙම ගමෙහි පවුල් 121ක් ජීවත් වේ. වර්තමානයේ දී පමණක් නොව අතීතයේ දී පවා ගමෙහි සමාජ සංවිධානය පිළිබඳ ව සාකච්ඡා කරන විට මුලින් ම අවධානය කළ යුත්තේ පවුල නම් ඒකකය වෙතයි.

මෙම ගමෙහි පවුල් නිර්මාණය වීමේ දී සාමාන්‍යයෙන් එක් පවුලක සාමාජිකයින් දහයක් පමණ ජීවත් වූ බවක් හඳුනාගත හැකි ය. අතීතයේ සමාජය තුළ කුල ගණනාවක් ජීවත් වී සිටි අතර එම සමාජ ක්‍රමය තුළ දී සමාජයේ පැවති ප්‍රධාන තනතුරු පවා කුල ක්‍රමය පදනම් ව හිමි වී ඇත. ඒ සඳහා ආරච්චිකම, දේවාලවල කපු මහතා හා වෙලේ විදානේ යන තනතුරු කදිම නිදසුන් වේ. අතීතයේ දී ගම තුළ කුලීන හා කුලහීනයින් ගමෙහි ජීවත් වී ඇත. කුලයෙන් පහත් වූවෝ වී කෙටීම, විවාහවල දී කැවුම් පෙට්ටි රැගෙන යෑම වැනි කාර්යය සඳහා ගම තුළ ජීවත් වී ඇත. අතීත සමාජය තුළ ගම්කාරයින් ජීවත් වී සිටි අතර පිටගම්කාරයින් ජීවත් වී නොමැත. ඒ අනුව විවාහ කටයුතු පවා සිදු වී ඇත්තේ ගම තුළ දී ය. අතීතය තුළ සාම්ප්‍රදානුකූලත්වය මත පදනම් ව සමාජ ස්තරයන් තිබූ මෙම ගමෙහි වර්තමානය වන විට ඇතැම් සාධක වෙනස් වී ඇත. මෙම ගමෙහි අතීතයේ සමාජය තුළ ප්‍රධානත්වය ගනු ලබන්නේ පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ය. සමාජ තත්ත්වය පිළිබඳ ව අධ්‍යයනයේ දී ගමෙහි ජීවත් වූ පුද්ගලයින්ගේ ඇදහිලි විශ්වාස, භාෂාව, ආහාර රටාව හා චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳව සාකච්ඡා කළ යුතුවේ. ඒ අනුව ගමෙහි ජීවත් වූ පුද්ගලයින් දේව ඇදහිලි හා විශ්වාස දැඩි ලෙස පිළිගත් අය විය. මොවුන් කතාබහ කරන විට පවා ඒ පිළිබඳව

අවබෝධ වේ. මොවුන්ගේ අතීත ජන සමාජය තුළ පැවති චාරිත්‍ර අතර කෘෂිකර්මාන්තයේ දී, කමත නිර්මාණය කිරීම, වංකගිරිය ඇඳීම ආදී කටයුතු පැවතී තිබී ඇත. කෘෂිකර්මාන්තයේ දී අලුත් සහල් ලබා ගැනීමෙන් අනතුරුව අත්යාල බුදුන් උදෙසා පූජා කිරීම, වන්නිබණ්ඩාර දෙවියන් උදෙසා අඩුක්කු දානය පූජා කිරීම, කිරි අම්මා දානයන් හා යක්කන් නටන පූජාව වැනි පූජා කර්මයන් මොවුන් විසින් සිදු කර ඇත. මේවා වර්තමානයේ දී පවා දැක ගැනීමට හැකියාවක් පවතී. අතීතයේ දී මෙම ගම්වැසියෝ තුළ සාම්ප්‍රදායික ඥාණය නොමඳ ව පැවත ඇති බවක් හඳුනාගැනීමට පුළුවනි. ඒ අනුව වින්නඹු අම්මා හා වෙදමහත්තයා වැනි පුද්ගලයින් සතුව එම ඥාණය නොමද ව අන්තර්ගත වී තිබූ බවක් විවරණය වේ. සිංහල අත්බෙහෙත්, යන්ත්‍ර මන්ත්‍ර ආදීන් මොවුන් විසින් සිදු කර ඇත. මීට අමතරව කෘෂිකර්මාන්තයේ දී වගා සඳහා අවශ්‍ය ජලය සපයා ගැනීම සඳහා විවිධ උපක්‍රම යොදා ගෙන ඇති අතර ඒවා මගින් මොවුන්ගේ සාම්ප්‍රදායික ඥාණය පිළිඹිබු වේ. අමුණු බැඳීම ඒ සඳහා නිදසුන් වේ. මොවුන් අතීතය තුළ වී වගාවට අමතර ව බඩඉරිඟු, කුරක්කන්, මුං, මෑ වැනි ධාන්‍ය වර්ග වගාකොට ඇත. ඒ අනුව අතීතයේ මීමුරේ ගම්මානය ස්වයංපෝෂිත ග්‍රාමයක් ලෙස හඳුනාගත හැකි ය.

මෙම ග්‍රාමයේ අතීතයේ පැවති ආර්ථික තත්ත්වය පිළිබඳ ව අවධානය යොමු කරන විට ප්‍රධාන ජීවනෝපාය ලෙස කෘෂිකර්මාන්තය හඳුනාගත හැකි ය. එහි දී ප්‍රධාන වන්නේ වී වගාවයි. වී වගාවන් අතර සුදු වී, හීන් වී හා මුහුදු කිරිවැල් යන වී වගා කර ඇත. කෘෂිකර්මාන්තයේ දී කුල්ල, යටි නඟුල, ලී නඟුල, බෝලත්ත යන උපකරණ භාවිතා කර ඇත. කෘෂිකර්මාන්තය ආශ්‍රිතව බොහෝ කාර්යයන් සිදු කර ඇත්තේ මී ගවයින් උපයෝගී කරගෙන ය. අතීතය තුළ දී මෙම ගම වෙතට බාහිරයෙන් අවශ්‍ය වූයේ ලුණු පමණි. ඒ අනුව මුස්ලිම් ජාතිකයින් විසින් මෙම ගමට තවලම් මඟින් භාණ්ඩ ගෙනවිත් ඇත. ඒ අනුව අතීතය තුළ මීමුරේ ග්‍රාමය ස්වයංපෝෂිත ආර්ථික රටාවකට උරුමකම් ලද ග්‍රාමයක් ලෙස ද හඳුනාගැනීමට හැකි ය.

මෙම සාධක ඔස්සේ මීමුරේ ගම්මානයෙහි අතීතයේ ජන සමාජයේ සාමාජීය ලක්ෂණ පිළිබඳව අවබෝධයක් අප වෙත ලැබිණි. මෙම ග්‍රාමයෙ හි ස්වභාව සෞන්දර්යය සමඟ මුසු වී නමුත් නිහඬව පවතින විවිධ වූ වටිනා කාරණාවන් රැසක් පිළිබඳ ව දැනගැනීමට ද මෙම අධ්‍යයනය ඔස්සේ හැකි විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

**(සම්මුඛ සාකච්ඡා)**

ඒකනායක මුදියන්සේලාගේ මුදලි මහතා, මීමුරේ, (වයස 93), 2023/06/13

එම්.කේ.ජී.කුසුමාකුමාරි මහත්මිය, මීමුරේ, (වයස 53), 2023/06/13

හේරත් මුදියන්සේලාගේ මුතුබණ්ඩා මහතා, මීමුරේ, (වයස 67), 2023/06/1